# ‘පට්ඨාන’ ධර්ම දේශනා මාලාවේ
# 05.07.2018 දින පැවැත්වූ දේශනාව

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සම්මා සම්බුදුරජාණන්වහන්සේට දස පාරමී ධර්මයන්ගෙන් පිරුණා වූ පිනෙන් පිරුණා වූ ගුණයෙන් පිරුණා වූ සීල පුහුණුවෙන් පිරී ගියා වූ සමාධි ගුණ වැඩීමෙන් පිරී ගියා වූ ප්‍රඥා පරිභාවිතා කළ ශක්තියෙන් පිරී ගියා වූ ශාන්තිනායක සම්මා සම්බුදු පියාණන්වහන්සේට අතීතයත් අනාගතයත් වර්තමානයත් යන කාල තුනටම සම්බන්ධව පවතින්නා වූ සියලුම ධර්මයන් විසදව පැහැදිලිව ප්‍රත්‍යක්ෂව අවබෝධය කොට ගත්තාවූ ශාන්තිනායක සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා! ඒ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන්වහන්සේගේ සන්තානයේ පහළ වූ උන්වහන්සේගේ බුදු නුවණින් දැක දේශනා කොට වදාළා වූ ශ්‍රී සත්ධර්ම ස්කන්ධයට ධර්ම රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා! ඒ උතුම් වූ සුපරිසුද්ධ වූ ධර්ම මාර්ගයේ ගමන්කොට නිර්වාණ ධාතුවට ශාන්තව වැඩම කොට වදාළා වූ ලෝකයේ අග්‍ර දක්ෂිණාර්ය වූ ශ්‍රාවක මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ ධර්ම රත්නයේ සංඝ රත්නයේ අනන්ත අපරිමාණ ගුණ ආනුභාව බලයෙන් ඒ වාගේම තුනුරුවන් ගුණ සිහිකොට එක මොහොතකට හෝ වන්දනා කිරීමෙන් ලද කුසල චේතනාවන්ගේ ධර්ම චේතනාවන්ගේ ආනුභාව බලයෙන් සහ අපේ පින්වත් සැම දෙනාම මේ අවස්ථාව වෙනකොට දියුණු කරගෙන තිබෙන්නා වූ වඩා තිබෙන්නා වූ රැස් කරගෙන තිබෙන්නා වූ සීල සමාධි ප්‍රඥා ගුණයන්ගේ ආනුභාව බලයෙන් අදත් අපි මේ ධර්ම සාකච්ඡාව තුලින් ධර්ම විස්තර කරදීම තුලින් ඉදිරිපත් කරන්නා වූ ධර්ම කරුණුටික මේ පින්වත් සැම දෙනාටම හොඳින්ම පැහැදිලිව වැටහේවා! තේරුම් ගන්න ලැබේවා! ඒ සඳහා නුවණ පහළ වේවා! ඒවාගේම සිහිය නුවණ ක්‍රියාත්මක

වෙලා සිත සමාධි ගතවෙලා මේ ධර්ම කරුණු හොඳට වටහාගෙන භාවනාවක් අනුසාරයෙන් භාවනාවක් විදියට දහම් කරුණු අවබෝධ කරගෙන සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යය ස්වභාවය දුක්ඛ ස්වභාවය අනාත්ම ස්වභාවය වටහාගෙන සැම දෙනාටම සසර දුකෙන් මිදී නිවනින් සැනසෙන්න ලැබේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

අද තිබෙන්නේ ගිය සතියේ කථාකරලා අපි නවත්තපු තැනක ඉඳලා කියන්න තිබෙන අභිධර්ම විස්තරයක්. අදත් අපි චිත්ත වීථි පිළිබඳව කථා කරන්න යන්නේ. අපේ පින්වතුන් මීට බොහෝම කලින් අවුරුද්දකට දෙකකට පමණ ඉහතදී දැන තේරුම් ගත්තා චිත්ත වීථියක් යනු කුමක්ද කියලා. චිත්ත වීථි ක්‍රියාත්මක වෙන්නේ අරමුණක් සම්බන්ධයෙන්, අරමුණට හිත ගොඩ වීම් වශයෙන් අරමුණ පැත්තට සිත ගලාගෙන යෑම් වශයෙන් අරමුණ පැත්තට සිත යොමු වීම් වශයෙන් එක්තරා ක්‍රමයකට එක්තරා පිළිවෙලකට පහළ වී එන්නා වූ සිත් පේළියට කියනවා චිත්ත වීථිය කියලා. අරමුණට ගලාගෙන යන අරමුණට යොමු වෙන ඒ සිත් පෙළවල්, ඒ චිත්ත වීථි බාහිර වශයෙන් නම් ඇස සම්බන්ධයෙන් යන චක්ඛු ද්වාරික චිත්ත වීථි තිබෙනවා. කන සම්බන්ධයෙන් සෝතද්වාරික චිත්ත වීථි තිබෙනවා. නාසය සම්බන්ධයෙන් දිව සම්බන්ධයෙන් චිත්ත වීථි තිබෙනවා. කය සම්බන්ධයෙන් කායික චිත්ත වීථි තිබෙනවා. මේ පහට ඇතුලත් නොවෙන චිත්ත වීථි මනෝද්වාරික චිත්ත වීථි නම් වෙනවා. මනසේ හැදෙන්නා වූ අරමුණක් උනත් චිත්ත වීථි රාමුව යටතේ සිත් පේළි ගලාගෙන ගිහිල්ලා ඒ සිත් පේළි වලින් තමයි ඒවා ක්‍රමානුකූලව තේරුම් ගන්නේ අවබෝධ කරගන්නේ සහ දැන ගන්නේ.

මේ සිත් පේළිවල තවත් සැඟවුණු ධර්ම සවභාව ටිකක් තිබෙනවා. ආන්න ඒ ධර්ම ස්වභාව අහුලා බැලීමක් ඒ ශක්ති ගුණ වෙනම මැන ගැනීමක් තමයි මේ පට්ඨාන දේශනා අනුසාරයෙන් සාකච්ඡා මාර්ගයෙන් අපි මේ කථා කරගෙන යන්නේ. ගිය සතියේ අපි කථා කළා කොහොමද අනන්තර ප්‍රත්‍යය කියන ඒ ධර්ම ස්වභාවය කුසල සිතකින් තවත් සිතකට බලපාන්නේ කියලා. අද කථා කරන්න තිබෙන්නේ අකුසල ධර්ම සම්බන්ධයෙන්. ඒක අනන්තර ප්‍රත්‍යය විස්තර කිරීම සඳහා යොදා ගන්නාවූ විසර්ජනා වාරය යටතේ තිබෙන තුන්වෙනි වීථියයි. එතන තිබෙනවා මෙහෙම.

**3). අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියලා විග්‍රහාත්මක පාලි පාඨය කියනවා.

**අකුසලො ධම්මො** = අකුසල ධර්මය
**අකුසලස්ස ධම්මස්ස** = තවත් අකුසල ධර්මයකට
**අනන්තරපච්චයෙන පච්චයො** = අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

අපි නැවත මතක තබා ගන්න ඕනෑ **අකුසලො ධම්මො** කියන තැන මේ කියන්නේ අකුසල් සිත් 12 බව. ඒ අකුසල් සිත් 12 තමයි ලෝභ මූල සිත් 8 + ද්වේශ මූල සිත් 2 + මෝහ මූල සිත් 2 යන අකුසල ධර්ම. නමුත් මේ අකුසල ධර්ම දොළහම චිත්ත වීථියක වැඩ කරනේ නෑ. ක්‍රියාත්මක වෙන්නේ නෑ. ගොනුවෙන්නේ නෑ. මේ දොළහෙන් එක සිතක් එක චිත්ත වීථියක වාර හතක් මතුවෙනවා. ඒක අපි නැවත හිතා ගත්තොත් මෙහෙමයි. අපිට සද්දයක් ඇහෙනවා. ඒ ශබ්දයක් පිටින් මතුවෙන්නේ. ඒ ශබ්දය ග්‍රහණය කර ගැනීමට, දැන ගැනීමට භවාංගයේ සිට සිත ගමන් කරනවා ඒ ශබ්දය දෙසට. ඒක යන්නේ මෙහෙමයි. **භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - පංචද්වාර ආවර්ජන - සෝත විඤ්ඤාණ - සම්පටිච්ඡන - සන්තීරණ - වොත්ථපන - සෝමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික** කියන පළවෙනි ලෝභ මූල සිත. ඊට පස්සේ **හත් වතාවක්** මේ සිත එක පේළියට යනවා. ඒකට කියනවා **ජවන් සිත්** යනවා කියලා. ඊට පසුව **තදාරම්මණ** වශයෙන් තව සිත් දෙකක් ක්‍රියත්මක වෙලා ඒ සිත් පේළිය භවාංගයට යනවා.

දැන් මෙතැනදී බලන්න, **ලෝභ මූල පළවෙනි** සිත ක්‍රියාත්මක වෙච්ච තැන. ඔය සිත් පේළියේ හැම තැනම ඔය ලෝභ මූල සිත වැඩ කළේ නෑ. මැද්දැවක තමයි ක්‍රියාත්මක උනේ. හැබැයි සිත් පේළියක් ගියා. භවාංගයේ ඉඳලා ජවන් දක්වාම මූලික අව්‍යාකෘත සිත් පෙළක් ගියා. ඒ කියන්නේ **භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - පංචද්වාර ආවර්ජන - සෝත විඤ්ඤාණ - සම්පටිච්ඡන - සන්තීරණ - වොත්ථපන** කියන මේ සිත් පේළිය අකුසල ධර්ම හැටියට සලකන්නේ නෑ. අකුසල ධර්ම හැටියට සලකන්නේ ජවන් හරියේ ඉඳලා. **පළවෙනි ජවනය - දෙවෙනි ජවනය - තුන්වෙනි ජවනය - හතරවෙනි ජවනය - පස්වෙනි ජවනය - හයවෙනි ජවනය - හත්වෙනි ජවනය** කියන ජවන් හැටියට වැඩ කරන ජවන් නමින් ක්‍රියාත්මක වෙන **සෝමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික** කියන ලෝභ මූල සිත තමයි මෙතන **අකුසල ධර්ම**

**කියලා** කියන්නේ. ඊළඟට **තාදරම්මණ** යනවා, චිත්ත වීථිය අවසන් උනා. භවාංගයට පත් උනා.

මෙතැන මේ සිත් පෙළේ බලන්න එක සිතක් අනෙක් සිතට වෙනස්. භවාංගය භවාංග චලනයට වෙනස්. භවාංග චලනය උපච්ඡේදයට වෙනස්. උපච්ඡේදය පංචද්වාරා ආවර්ජන සිතට වෙනස්. පංචද්වාරා ආවර්ජන සිතට වඩා වෙනස් සෝත විඤ්ඤාණ සිත. ඊට වඩා වෙනස් සම්පටිච්ඡන සිත. ඊටත් වඩා වෙනස් සන්තීරණ සිත. ඊටත් වඩා වෙනස් වොත්ථපන සිත. ඊට වඩා වෙනස් ජවන් සිත. එතකොට පළවෙනි ජවන් සිත නොවෙයි දෙවෙනි ජවන් සිත. දෙවෙනි ජවන් සිත නොවෙයි තුන්වෙනි ජවන් සිත. මේ සිත් උනත් එක වර්ගයේ උනාට අවස්ථා 7 යන්නේ. දෙවෙනි ජවනය පහළ වෙනකොට පළවෙනි ජවනය එතන නෑ. ඊළඟට තුන්වෙනි ජවනය පහළ වෙනකොට පළවෙනි ජවනයයි දෙවෙනි ජවනයයි ඒ වෙලාවේ නෑ. ඒවා ඔක්කොම අතීතයට කැඩිලා ගිහිල්ලා ඉවරයි. එතකොට හැම වේලාවකම අපේ සිතේ තිබෙන්නේ චිත්ත වශයෙන් එකම එක හිතක් විතරයි. අනිත් සිත් ඇවිල්ලා නෑ, ඒවාගේම පහළ වූ සිත් අතීතයට ගිහිල්ලා. මේ විදියට ළඟින් ළඟින් කිට්ටුවෙන් කිට්ටුවෙන් ගැවීගෙන මතුවෙන වෙන වෙනම හැඩතල තිබෙන සිත් පේළියක් තිබෙනවා. ඔය සිත්වල තිබෙනවා එක සිතකින් අනිත් සිතට බලපාවන ඒ වාගේම ගැම්මක් දෙන ගතියක්. එයින් එකක් තමයි මේ **අනන්තර ප්‍රත්‍යය** කියලා කියන්නේ.

මේක මෙහෙම කිව්වේ නැවත වතාවක් මේ පින්වතුන්ගේ ධර්ම අවබෝධයට පහසුවක් ලෙහෙසියක් සිද්ධවෙන නිසයි. ගිය වතාවෙත් ගිය සතියෙත් මීට පෙරත් මේ කථාව අපි කිව්වා මතු කළා පහදලා දුන්නා. අදත් මේ කියන්නේ අද මේ කථාව තේරුම් ගන්න මේ පින්වතුන්ට උපකාර වෙන නිසා.

මේ **අනන්තර ප්‍රත්‍යය** තිබෙන තැනක් තිබෙනවා. **අනන්තර ප්‍රත්‍යය** තිබෙන්නේ පළමුවෙන් පහළ වෙන්නා වූ නැති වී යන සිතේ. පළමුවෙන් පහළ වෙච්ච සිතේ තමයි **අනන්තර ප්‍රත්‍යය** ශක්තිය තිබෙන්නේ. ඒ කියන්නේ ඊළග සිතට අමුතු විදියේ ගැම්මක් බලපෑමක් ශක්තියක් අනුකූල ස්වභාවයක් පවත්වාගෙන යන ස්වභාවය සහ ලබාදෙන ගතිය.

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො =** අකුසල ධර්මයක් අකුසල ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. එහෙම නම් මෙතැනදී අපි අකුසල ධර්ම කියන මේ සිත් පෙළේ අකුසල ධර්ම කියන තැනට යන්න ඕන. උදාහරණයක් හැටියට ගත්තේ ලෝභ කරන සෝත විඤ්ඤාණයක්. අකුසල ධර්ම කියන ඒවා තිබෙන්නේ ජවන් 7 ක්‍රියාත්මක වෙන තැන. පළවෙනි ජවනය අකුසල ධර්මයක්. දෙවෙනි ජවනයත් අකුසල ධර්මයක්. තුන්වෙනි හතරවෙනි ජවනත් අකුසල ධර්ම. ඊළඟට පස් වෙනි හය වෙනි හත්වෙනි ජවන් ඔක්කොම අකුසල ධර්ම, ලෝභ සහගතයි. මේ විදියට යනකොට පළවෙනි ජවන් අකුසල් සිත නැතිවී යන්නේ දෙවෙනි ජවනයට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය ගුණයක්, ප්‍රත්‍යය ශක්තියක් වීසි කරගෙන. ඒවාගේම තල්ලු කරගෙන. ඒ දෙවෙනි සිතට උපදින්න යම් කිසි ක්‍රමයක් ලබා දීගෙන. ආන්න ඒ අවස්ථාවේ අපි කියනවා **අකුසල ධර්මයක් අකුසල ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය උනා** කියලා. දැන් බලන්න පළවෙනි ජවනය දෙවෙනි ජවනයට අනන්තර ප්‍රත්‍යය ශක්තියක් ලබා දුන්නා. දෙවෙනි ජවනය තුන්වෙනි ජවනයට අනන්තර ප්‍රත්‍යය ශක්තිය ලබාදෙන කොට තිබෙන්නෙත් **අකුසල ධර්මයක් අකුසල ධර්මයකට ප්‍රත්‍යය වෙන එකයි.** හේතුව, මේ ජවන් හතේම යන්නේ එකම වර්ගයක අකුසල සිත්. දැන්මේ විදියට දෙවෙනි එකෙන් තුන්වෙනි එකට - තුන්වෙනි එකෙන් හතරවෙනි එකට - හතරවෙනි එකෙන් පස් වෙනි එකට - පස්වෙනි එකෙන් හයවෙනි එකට - හයවෙනි එකෙන් හත්වෙනි එකට **අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා මේ සියල්ල අකුසල් නිසා.**

එතකොට මේකේ තිබෙනවා මෙහෙම ක්‍රමයක්. අපි ඒකත් මතක තබා ගන්න ඕනෑ. ඔය ජවන් සිත් හත චිත්ත වීථියක පහළ වෙනකොට ඔය සිත තනියෙන් හුදකලාව පහළ වෙන්නේ නෑ. ඔය සිතක තිබෙනවා යම් කිසි ප්‍රමාණයක ක්‍රියාත්මක වෙන චෛතසික ධර්ම සමුදායක්. පළවෙනි ජවනයේත් තිබෙනවා. දෙවෙනි ජවනයේත් තිබෙනවා ඒ ගානම. තුන්වෙනි හතරවෙනි පස්වෙනි හයවෙනි හත්වෙනි ජවන් සිත් වලත් තිබෙනවා ඒ ගානම චෛතසික. පළවෙනි ජවනයේ චෛතසික 20 වැඩ කළානම් හත්වෙනි ජවනය දක්වා පහළ වෙන හැම ජවනයකම චෛතසික 20 බැගින් තිබෙනවා. ඉතින් මේ ජවන් සිත පහළ වෙන්නේ චෛතසික පොකුරකුත් එක්ක. ඒ චෛතසික ධර්ම අස්සේ තිබෙනවා වේදනාව. සංඥා චෛතසික තිබෙනවා. ඵස්ස තිබෙනවා. සංඛාර තිබෙනවා. චේතනා තිබෙනවා. ඔය ඔක්කොම තිබෙනවා. සිතත් ඒ එක්කම තිබෙනවා. ඒක නිසා චෛතසික ධර්මත් එක්ක කථා කරන කොට ඒවා විස්තර

කරන්නා වූ ලස්සන ගාම්භීර ඒවාගේම අර්ථාන්විත පාලි පාඨයක් පට්ඨාන ප්‍රකරණයෙහි ඉදිරිපත් කරනවා මේ විදියට.

**පුරිමා පුරිමා අකුසලා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ඛන්ධානං අනන්තරපච්චයෙන පච්චයො.**

**පුරිමා පුරිමා අකුසලා ඛන්ධා** කියලා කිව්වේ පළවෙනි ජවයේ තිබෙන්නේ අකුසල ස්කන්ධයෝ ටිකක්. ඒ කියන්නේ පළවෙනි ජවනයේ තිබෙනවා 'වේදනා' 'සංඥා' 'සංඛාර' සහ 'සිත' (විඥ්ඥාණය ). ඒ ටික ඔක්කොම එකට අරගෙන මෙතන කියනවා **අකුසල ඛන්ධයක්** කියලා. සිතත් එක්ක තිබෙන ඒ චෛතසික පොකුර අකුසල ඛන්ධ හැටියට පළවෙනි ජවනය නමින් පහළ වෙලා ඒ ටික නැතිවෙනවා. **පුරිමා පුරිමා අකුසලා ඛන්ධා** කියන ටික නැතිවෙන කොට නැවතත් දෙවෙනි ජවනය හැටියට පහළ වෙන්නේ තවත් ඒ වගේ චෛතසික රංචුවක් එක්ක තවත් ජවන් සිතක්. **පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ඛන්ධානං** කිව්වේ ඒකයි. ඒ කලින් පහළ වෙච්ච අකුසල ස්කන්ධ ටික පස්සේ පහළ වෙන අකුසල ස්කන්ධයන්ට **අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය** වෙනවා. එහෙම ශක්තියක් ඒකෙ තිබෙනවා. දෙවෙනි එකෙන් තුනට, තුන් වෙනි එකෙන් හතරවෙනි එක, හතරෙන් පහට ඒ වගේ ඔක්කොම ජවන් සිත්වලට ගලපන්න පුළුවන්.

හැබැයි මේ සිත් පේළියේ අවසාන එනම් හත්වෙනි ජවනයට පුළුවන් හයවෙනි ජවනයෙන් ප්‍රත්‍යයක් ලබන්න. ඒ කියන්නේ හයවෙනි ජවනයෙන් දීපු අනන්තර ප්‍රත්‍යය ශක්තිය, අනන්තර ප්‍රත්‍යය ගුණ විශේෂය, අනන්තර ප්‍රත්‍යය ධර්ම විශේෂය ලබාගන්න පුළුවන් අවසාන 7 වෙනි ජවනයට. එතකොටත් මේ **අකුසල ධර්මයක් අකුසල ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය** වෙනවා කියන පාඨය ගැලපෙනවා. හත්වෙනි ජවනයත් අකුසල තමයි. නමුත් හත්වෙනි ජවනයෙන් පස්සේ **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කථා කරන්න බෑ. ඒකට හේතුව, හත්වෙනි ජවනය අකුසල ධර්මයක් උනාට ඒකෙ ශක්තිය ගන්න එක්කෙනා අකුසල ශක්තිය තිබෙන එකක් නොවෙයි. ඒක වෙන වර්ගයක සිතක් නිසා මෙතනදී හත්වෙනි එකෙන් එහාට යන්නේ නෑ. ඒක නිසා හත්වෙනි ජවනය මෙතෙන්ට පාවිච්චි කරන්නේ නෑ. **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියන කථාව, මේ දහම් පදය, මේ දහම් විස්තරය ගැලපෙන්නේ පළවෙනි ජවන් සිත් හයකට පමණයි. **හත්වෙනි**

**ජවනය මෙතනදී අතහරිනවා. අතහරින්නේ අනන්තර ප්‍රත්‍යයෙන් වෙන්න ඊළග එක්කෙනා අකුසලයක් නොවෙන නිසා.** ඔය ටික අපි ඔය විදියට තේරුම් ගනිමු. මතක තබා ගන්න ඕන හත්වෙනි ජවනයෙන් එහාට යන කථාව මෙතන නවත්වලා තිබෙන්නේ. ඒ වාගේම තමයි පළවෙනි ජවනයට කලින් හන්දිය අපි කථා කළේ නෑ. මේ මාතෘකාව යටතේ ජවන් ටිකේ පළවෙනි ජවනයේ ඉඳලා හත්වෙනි ජවනය දක්වා කථා කළා. හත්වෙනි ජවනය අකුසල ධර්මයකට ප්‍රත්‍යය ශක්තිය දෙන්න පුළුවන් එකක් නොවෙයි. ඒක නිසා ඔය විදියට අපි මේ ජවන් සිත් හතෙන් පළවෙනි හය ගලපලා ගන්න ඕන තේරුම් ගන්න මේ කථාවට අනුකූලව.

ඊළහට අපි යනවා තවත් කථාවක් කින්න. ඒ විස්තරය මෙහෙම තිබෙනවා

## 4) අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො

මේ විස්තරය වෙනස්. අපි ඉස්සෙල්ලා කිව්වේ අකුසල ධර්මයක් අකුසල ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියලා. මෙතැන කියන්නේ **අකුසල ධර්මයක් අබ්‍යාකත ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය** වෙනවා කියලා. මොකක්ද මෙතන තිබෙන අබ්‍යාකතය? ඒ තමයි හත්වෙනි ජවනයෙන් පස්සේ පහළවෙන සිත.

භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - පංචද්වාර ආවර්ජන - සෝත විඤ්ඤාණ - සම්පටිච්ඡන - සන්තීරණ - වොත්ථපන - ජවන් - ජවන් - ජවන් - ජවන් - ජවන් - ජවන් -ජවන් - **තදාරම්මණ** - තදාරම්මණ

අපි කථා කළේ හත්වෙනි ජවනය ගැන. ඒක අකුසල ජවනයක්. හැබැයි හත්වෙනි ජවනයෙන් පස්සේ පහළවෙන **8 වෙනි හිත තදාරම්මණ සිතක්**. ඒ සිත අව්‍යාකෘත ධර්මයක්. ඇයි අව්‍යාකෘත කියලා කියන්නේ? නැවත මතක් කරගන්න, නැවත තමන්ගේ සිතට සිහි ගන්වා ගන්න. සිතේ අවබෝධය උඩට මතුකර ගන්න මේ කියන කථාවට උදව්වක් උපකාරයක් හැටියට. අව්‍යාකෘත ධර්ම කියලා කියන්නේ ඉදිරියේදී විපාකයක් හදලා දෙන්න ශක්තියක් නැති සිත් වලට. ක්‍රියා සිත් වල මේක තිබෙනවා. රහත් නොවුනත් අපිටත් ක්‍රියා සිත් දෙකක් තිබෙනවා. මනෝද්වාර ආවර්ජන සිත සහ පංචද්වාර ආවර්ජන සිත. හසිත උප්පාදය කියන ක්‍රියා සිත රහතන්වහන්සේලාටයි. මේ ක්‍රියා සිත් දෙකත්

අව්‍යාකෘතයි. අනිත් අව්‍යාකෘත සිත් තමයි විපාක. මේ විපාක අව්‍යාකෘත වලට බෑ අනාගතයේ වෙන විපාක හදන්න. මේ විදියට අව්‍යාකෘත සිත් තිබෙනවා.

චිත්ත වීථියක තිබෙන හත්වෙනි ජවන් සිත **අකුසල ධර්මයක්**. හත්වෙනි ජවනයෙන් පස්සේ ඇති වෙන්නේ අව්‍යාකෘත ධර්මයක්. ඒක නිසා කියනවා **අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියලා. දැන් එතකොට හත්වෙනි ජවනයේ අනන්තර ප්‍රත්‍යය ශක්තිය ලබන්නේ **8 වෙනි තදාරම්මණ විපාක සිතයි.**

(භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - පංචද්වාර ආවර්ජන - සෝත විඤ්ඤාණ - සම්පටිච්ඡන - සන්තීරණ - වොත්ථපන - ජවන් - ජවන් - ජවන් - ජවන් - ජවන් - ජවන් - ජවන් - **තදාරම්මණ** - තදාරම්මණ)

එතකොට ඒකට ශක්තිය ලබාදෙන්නේ කවුද? 7 වෙනි ජවන් සිතයි. ඒක විස්තර වශයෙන් කියනකොට මෙහෙමත් වෙනවා.

අපිට මෙතැනදී ප්‍රශ්නයක් ඇතිවෙනවා. ඒ තමයි සිත් 17 ක් යන හැම චිත්ත වීථියකම තදාරම්මණ ක්‍රියාත්මක වෙන්නේ නෑ. සමහර චිත්ත වීථිවල තිබෙනවා ජවනයෙන් පස්සේ එක පාරම භවාංගයට යනවා. ඒ භවාංගත් අව්‍යාකෘතයි. ඒවත් විපාක අව්‍යාකෘත.

අපි හිතමු මෙහෙම. මනුස්ස ලෝකයේ මිනිස්සු 8 දෙනෙක් කුඹුරක් කරලා ස්වාමීන්වහන්සේලා වඩමවලා දානමය පිංකමක් කරනවා. මේ අට දෙනාගේ දැනුම ආකාර 8 යි. සමහරුන්ට ශ්‍රද්ධාව තිබෙනවා. සමහරුන්ට සතුට තිබෙනවා. සමහරුන්ට නෑ. සමහරුනට ඥානය තිබෙනවා සමහරුන්ට නෑ. සමහරුන්ට ඕනෑ කමින් පිංකම කරන්න පුළුවන්. උද්‍යෝගයක් තිබෙනවා, motivation එකක් තිබෙනවා. හැබැයි සමහරුන්ට එහෙම නෑ. ඔය වගේ විවිධත්වයකින් යුක්තව මේ මනුස්සයෝ අට දෙනා පිංකම් සිද්ධ කරනවා. සාංඝික දානයක් සංඝ උපස්ථානයක් සිද්ධ කරනවා. මේකේ ඵල විපාක හැටියට මේ ගොල්ලෝ ස්ථාන කීපයක උපදිනවා. මේ අට දෙනාම දිව්‍යලෝකයට යන්නේ නෑ.

ඥාන සම්ප්‍රයුක්තව පිංකම් කරගත්තාවූ සතර දෙනෙක් දිව්‍යලෝක සුගතියට පත්වෙනවා. එවාගේම ඥානය අඩුවෙන් පිංකම කරගත්ත හතර දෙනා මනුස්ස ලෝකයේ උපදිනවා ද්විහේතුක නිසා. එතකොට අපි හිතමු උදාහරණයක් හැටියට හතර දෙනෙක් මනුස්ස ලෝකයේ ඉපදුනා හතර දෙනෙක්

දිව්‍යලෝකයේ ත්‍රි හේතුක ප්‍රතිසන්ධියක් ඇතුව ඉපදුනා. එතකොට මේ මනුස්ස ලෝකයේ උපන්නා වූ හතර දෙනාට ඒ තරම්ම ඥානයක් බුද්ධියක් නෑ. නමුත් මනුස්ස ලෝකය සුගතියක්. දිව්‍යලෝකයේ උපන්නා වූ හතර දෙනාට යම්කිසි ශක්තියක් තිබෙනවා. දිව්‍යක්ඥානය තිබෙනවා, හොඳයි. දැන් හතර දෙනෙක් ඉන්නවා මනුස්ස ලෝකයේ පිංකමේ අඩු ශක්තිය ඇතුව. හතර දෙනෙක් දිව්‍යයලෝකයේ. දිව්‍යලෝකයේ ඉන්නා වූ ඒ දෙවිවරු හතරදෙනාට ප්‍රතිසන්ධිය ලබා දුන්නේ මේ දානමය පිංකමෙන්, ඒ වාගේම ඒ දෙවිවරු හතරදෙනාට භවාංග වෙන්නෙත් ඒ ප්‍රතිසන්ධිය දීපු දානමය පිංකමම තමයි. එතකොට බලන්න භවාංගය විපාක සිතක්. ඊළඟට මේ මනුෂ්‍ය ලෝකයේ ඉන්නා වූ අයටත් මනුෂ්‍ය ලෝකයේ ප්‍රතිසන්ධිය ලබන්න පිහිට උනේ ඥානය අඩුවෙන් හරි කරපු ඒ දානමය පිංකම. ඒ අයටත් විපාක සිත් හැටියට පහළ වෙන්නේ භවාංග සිතක්. එතකොට අපි මෙහෙම හිතමු. මනුස්ස ලෝකයේ ඉන්නා වූ එක්කෙනෙකුට යම්කිසි දෙයක් ගැන අහන්න ලැබෙනවා. සැපවත් දෙයක් ආහාර පාන ලාභයක් හරි මොකක් හරි අහන්න ලැබෙනවා. එයාට එවිට ලෝභ හිතක් පහළ වෙනවා. ඒ ලෝභ හිත පහළ වෙනකොට චිත්ත වීථියක් යනවා. මේ කියාපු කථාවට අනුව චිත්ත වීථියේ ප්‍රථම ජවනය අකුසල. දෙවෙනි, තුන්වෙනි, හතරවෙනි, පස්වෙනි, හයවෙනි ජවනයත් අකුසල. හයවෙනි ජවනයෙන් අනන්තර ප්‍රත්‍යය ලබාගෙන හත්වෙනි ජවනයත් පහළ වෙනවා. හත්වෙනි සිත පහළ උනාට පස්සේ මේ කෙනාගේ සිත තදාරම්මණ වෙන්නේ නැතුව භවාංගයට යනවා. දැන් මෙයාට ලෝභ සිතක් පහළ උනා. ලෝභ සිත අකුසල් සිතක්. ඒ ලෝභ හත්වෙනි ජවනයත් අකුසල්. ඒ හත්වෙනි ජවනය කැඩිලා විනාස වෙලා යන එක්කම එයාගේ සිත භවාංගයට පත්වෙනවා. ඒ භවාංග සිත මීට ඉස්සරවෙලා මනුෂ්‍යලෝකයේ අට දෙනා එක්ක සිද්ධ කරපු දානමය පිංකමේ විපාක හැටියට පහළ වෙන භවාංග හිතයි. එතකොට ඒ භවාංග සිත ඊට ඉස්සරවෙලා ජීවිතියේ කුසල් සිතක් උනාට මේ වෙලාවේදී ඒක විපාකයක්. ඒක නිසා භවාංග සිත අව්‍යාකෘත සිතක්. **ඒ භවාංග සිතට තමයි අර හත්වෙනි අකුසල් ජවනය අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ**. ආන්න එතකොට එතනටත් **අකුසල ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා** කියන ධර්ම විග්‍රහය ගලපන්න පුළුවන්.

දිව්‍යලෝකයේ ඉන්නා වූ දෙවි කෙනෙකුටත් ඔය විදියේ සිද්ධියක් වෙනවා. නන්දන වනයට යනවා. මල් එහෙම දකින්න ලැබෙනවා. නන්දන වනයට ගියාවූ දෙවි දේවතාවන්ට ඒ නන්දන උයනේ තිබෙන මල් දැකලා ලෝභ සහගත සිතක් පහළ වෙනවා. ඒ ලෝභ සහගත සිත අකුසල්. ඒ ලෝභ සහගත සිත

අකුසල් ජවනයක් හැටියට සිත් පේළියක පහළ වෙලා **භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - පංචද්වාර ආවර්ජන - චක්ඛු විඤ්ඤාණ - සම්පටිච්ඡන - සන්තීරණ - වොත්ථපන** - ඊට පස්සේ **අකුසල් ජවන්** යනවා. ඒ අකුසල් ජවන් ගිහිල්ලා කෙලවරේදී ඒ දේවතාවාගේ සිත **භවාංගයට යනවා.** ඒ දේවතාවාගේ භවාංග සිත පෙර මනුස්ස ලෝකයේදී කළා වූ පිංකමේ විපාකයක් හැටියට පහළ වෙන්නා වූ භවාංග සිතක්. ඒක නිසා එතනත් සිද්ධ වෙන්නේ හත්වෙනි ජවනයෙන් පස්සේ භවාංගය පහළ වෙනකොට **අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියලා.

ඔය විදියට මනුස්ස ලෝකයේ හතර දෙනාටමත් දිව්‍යලෝකයේ ඉන්න හතර දෙනාටමත් හතර අවස්ථාවකදී පහළ වෙන නිසා කුසල විපාක සිත් 8 ම භවාංගව වැඩ කරන නිසා **මහා විපාක සිත් 8** කියලා කියනවා.

මහග්ගත වශයෙනුත් ඔහොමයි. ඒ කියන්නේ රූපාවචර අරූපාවචර විපාක භවාංග සිත්වලටත් ඕක වෙන්න පුළුවන් අවස්ථානුකූලව. හැබැයි තදබල විදියට අකුසල් සිත් පහළ වෙන්නේ නෑ බ්‍රහ්මලෝකවල. පොඩියට යන්තම් හරි අනුශය වශයෙන් හෝ වේවා ගැව්ච්ච ගතියක් තිබෙනවා නම් ඒක අකුසල් සිතක් හැටියට තමයි එතෙන්දි ගලපන්නේ.

මෙතෙක් අපි අකුසල සිත් 12 හේ අන්තිම ජවනය ප්‍රත්‍යය වෙන ආකාරය මතක් කළා. ලෝභ මූලය තදාරම්මණයට ප්‍රත්‍යය වෙන එක කථා කළා. ඒක ද්වේශ මූලයටත් එහෙමයි. මෝහ මූලයටත් එහෙමයි.

එතකොට අද අපි අකුසල ධර්මයක් අකුසල ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන විදිය කිව්වා. අකුසල ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන ආකාරය මතක් කළා.

ඊළඟට තව චිත්ත විථියක් තිබෙනවා. ඒ චිත්ත විථියත් අපි පාලි භාෂාවේ අනුසාරයෙන් තේරුම් ගනිමු. ඒ තමයි

## 5) අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො

අව්‍යාකෘත ධර්ම ගැන කථා කරනකොට මතක තබා ගන්න අනාගතයට විපාක ශක්තියක් හදලා නොදෙන්නා වූ මේ අවස්ථාවේ ක්‍රියා මාත්‍ර ස්වරූපයෙන් පහළ වෙන්නා වූ පෙර සිතක විපාකයක් හැටියට පහළ වෙන්නා වූ සිත් වලට කියනවා අව්‍යාකෘත කියලා.

දැන් චිත්ත විථියක පළවෙනි හරිය තමයි මෙතනින් කියවෙන්නේ. අපි චිත්ත වීථියක මැද කථා කළා. පළවෙනි ජවනය - දෙවෙනි ජවනය - තුන්වෙනි ජවනය - හතරවෙනි ජවනය - පස්වෙනි ජවනය - හයවෙනි ජවනය - හත්වෙනි ජවනය ගැන කථා කළා. ඊට පස්සේ හතෙන් අටට සම්බන්ධවෙන හැටි කථා කළා = (ජවන් - **තදාරම්මණ**) හැබැයි චිත්ත වීථියක මුල හරිය කථා කළේ නෑ. දැන් අපි ඒ වගේ තැනකට යනවා, චිත්ත වීථියක මුල් හරියට.

දැන් බලන්න අපි හැම කෙනාම මොකක්වත් හිතන්නේ නැතුව බාහිර වශයෙන් අරමුණක් ගැන සලකන්නේ නැතුව හිතන්නේ නැතුව ඉන්නකොට අපිට ඇතිවෙන්නේ දිගටම භවාංග සිත්. භවාංග සිත් දිගටම ඇතිවෙන්න නම් නිද්‍රෝපගත වෙන්න ඕනෑ. හිත ක්‍රියාත්මක වෙනකොට ක්‍රියාත්මක සිත්වල අව්‍යාකෘත ධර්ම ස්වභාවය ටිකක් තිබෙනවා. දැන් අපි බලමු ඒ ගැන.

අපි නිදාගෙන ඉන්නකොට දිගටම භවාංග යනවා. පළවෙනි භවාංගයෙන් දෙවෙනි භවාංගයට. පළවෙනි භවාංගයත් අව්‍යාකෘතයක් දෙවෙනි භවාංගයත් අව්‍යාකෘතයක් තුන්වෙනි භවාංගයත් අව්‍යාකෘතයක් හතරත් පහත් හයත් හතත් සියල්ලම අව්‍යාකෘත ධර්ම. විනාඩි 15 හෝ පැය බාගයක් හීන දකින්නේ නැතුව යම්කිසි මනුස්සයෙක් නිදාගෙන හිටියොත් ඒ මනුස්සයාගේ දිගටම යන්නේ භවාංග සිත් පේළියක්. ඒ භවාංග සිත් පේළියේ පළවෙනි භවාංගයෙන් දෙවෙනි එකට දෙවෙනි භවාංගයෙන් තුන්වෙනි එකට, ඔය විදියට ඔක්කොම භවාංග සිත් අව්‍යාකෘත නිසා **අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියන ධර්මය සිද්ධ වෙනවා ගැලපෙනවා මේ භවාංග චිත්ත වීථියේදී.

ඊළඟට අපි හිතමු භවාංග වලින් කැඩිලා හිත බාහිරේට එනවා මනෝද්වාරික වශයෙන් හෝ පංචද්වාරික වශයෙන්. සිත එළියට එනවා ක්‍රියාත්මක වෙලා. එළියට එනකොට ...

- 'භවාංග සිත' 'භවාංග චලන' සිතට අව්‍යාකෘත ධර්මයක් හැටියට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

- 'භවාංග චලනය' 'භවාංග උපච්ඡේදයට' = අව්‍යාකෘත ධර්මය තවත් අව්‍යකෘතයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

- ඊළඟට 'භවාංග උපච්ඡේදයෙන්' 'පංචද්වාරාවජ්ජනයට' = අව්‍යාකෘත ධර්මය තවත් අව්‍යාකෘතයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

- 'පංචද්වාරාවජ්ජනයෙන්' 'චක්ඛු විඤ්ඤාණයට' = අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

- 'චක්ඛු විඤ්ඤාණයෙන්' 'සම්පටිච්ඡනයට' = අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

- 'සම්පටිච්ඡනයෙන්' 'සන්තීරණයට' = අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

- 'සන්තීරණයෙන්' 'වොත්ථපනයට' = අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

මේ ටිකේ හැම තැනම අව්‍යාකෘත ධර්මයක් තවත් අව්‍යාකෘත ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම තමයි තිබෙන්නේ. ඒක නිසා මේ හැම තැනකම **අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** නම් වෙනවා.

මේ හැම තැනකම පළවෙනි සිතෙන් දෙවෙනි සිතට පොඩි අමුතු කිව නොහැකි පෙන්නුම් කරන්න බැරි අමුතු විදියේ printout එකක්, තල්ලුවක්, ශක්තියක් වද්දගෙන යනවා. කැමයි කැමවල තිබෙන්නා වූ රස්නයයි ගැන හිතමු. අපි sponge කේක් එකක් පෝරණුවේ තිබිලා ගත්තා. හැබැයි අපි ගන්න කොට ඒ පෝරණුවේ තිබ්බ්ව අමුතුම රස්නේ ගතියක් ඒකට වැදිලා තිබෙනවා. අපි කනකොට රස්නේ ගතිය වෙනයි කැම එක වෙනයි. අපි හිතමු මෙහෙම. ඔය රස්නේ තිබෙන sponge කේක් එක කොළයක් උඩින් තබනවා. කොළේකට ගත්තහම ඒ sponge කේක් එකේ තිබෙන්නා වූ සුවඳත් ඒකෙ තිබෙන රස්නයත් ඒකෙ තිබෙන්නා වූ යම් කිසි ගුණයත් අර කොළේට ඇද ගන්නවා, ග්‍රහණය කර ගන්නවා, වද්ද ගන්නවා. අනන්තර ප්‍රත්‍යයත් අන්න ඒ වගේ. පළවෙනි සිතෙන් දෙවෙනි සිතට මොකක්දෝ ශක්තියක් අමුතුම විදියේ ගුණයක් ලබා දෙනවා. ඇයි මේ පළවෙනි සිත දෙවෙනි සිතට ඒ ශක්තිය ලබාදෙන්නේ? හේතුව, එහෙම ලබා දෙන්න පුළුවන් ශක්තියක් ඒකෙ තිබෙන නිසයි. ඒක නිසා කියනවා පළවෙනි එකෙන් දෙවෙනි එකට දෙන ඒ ශක්තියට **අනන්තර ප්‍රත්‍යය ශක්තිය** කියලා, මේ විස්තරයේදී.

මේකේ තිබෙනවා කරුණු දෙකක් තේරුම් ගන්න. එකක් තමයි ප්‍රත්‍යය ශක්තිය තිබෙන සිත. අනිත් එක තමයි ලබා ගන්න සිත. හැම වෙලේම දෙවෙනි සිත තමයි ප්‍රත්‍යය උප්පන්නය වෙන්නේ. පළවෙනි එකෙන් ගැම්මක් අරගෙන පළවෙනි එකෙන් ශක්තියක් අරගෙන උපදින්නා වූ ඒ දෙවෙනි සෑම සිතක්ම ප්‍රත්‍යය උප්පන්නයක් හැටියට තමයි සඳහන් වෙන්නේ.

ඔය කථාව බලාගෙන ගියහම දිගට තිබෙනවා භවාංග පහළ වෙන තැන්. ප්‍රතිසන්ධි සිත - ප්‍රතිසන්ධියෙන් පස්සේ භවාංග. ඊට පස්සේ පළමුවෙන් පළමුවෙන් ඇතිවෙන්නා වූ භවාංග. ඔය මම කියපු හැටියට සියලුම දේවල් 'විපාක' 'ක්‍රියා' ආදී සෑම දෙයක්ම ඔය විදියට එකින් එකට, එකින් එකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. මේ කිව්වේ **අව්‍යාකෘත ධර්ම අව්‍යාකෘත ධර්මයන්ට ප්‍රත්‍යය වෙන ආකාරයයි.**

මේකේ තව ගොඩක් තිබෙනවා. දැන් මේ කියාපු ටික හිතේ පින්තූර ගත කරගන්න පුළුවන් නම් මේ ටික සිතෙන් දරාගන්න පුළුවන් කම තිබෙනවා නම්

මේ පින්වතුන්ට පුළුවන් අනිත් ඒවා හොඳට තේරුම් ගන්න. මේකේ තිබෙනවා තව විස්තර කිරීම් ටිකක් දාල. අපි ඒකත් සලකලා බලමු.

- **පුරිමා පුරිමා විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං විපාකාබ්‍යාකතානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං අනන්තරපච්චයෙන පච්චයො**

මේක හොඳට බලන්න. මේකේ තිබෙන්නේ **විපාකාබ්‍යාකතා** = විපාක අව්‍යාකෘත ජාතියක් ගැන. ඒ කියන්නේ විපාකයක් නමුත් ඒක අව්‍යාකෘතයක්. භවාංගය **විපාකයක් ඒවගේම අව්‍යාකෘතයක්.** භවාංග චලන - භවාංග උපච්ඡේද ඒ සියල්ල විපාක ඒවගේම අව්‍යාකෘත. ඊළඟට චක්ඛු විඤ්ඤාණය විපාක **අව්‍යාකෘතයක්.** ඊළඟට සන්තීරණ සම්පටිච්ඡන ඒවත් **විපාක අව්‍යාකෘත.** ඊට පස්සේ තදාරම්මණ - ඒකත් **විපාක අව්‍යාකෘතයක්.**

මේ පළමුවෙන් පළමුවෙන් පහළ වෙන්නා වූ විපාක අව්‍යාකෘතයෝ දෙවෙනුවට දෙවෙනුවට පහළ වෙන අව්‍යාකෘතයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියලා කියනවා.

- **භවඞ්ගං ආවජ්ජනාය අනන්තරපච්චයෙන පච්චයො**

දැන් බලන්න මෙතැන අපේ පින්වතුන්ට මීට කලින් මේ කථාව මතක් කරළා තිබෙනවා. පංචද්වාර ආවර්ජන සිත තිබෙන්නේ චිත්ත වීථියක 4 වෙනි සිත හැටියට. මේකට කියනවා **ආවර්ජන සිත** කියලා. මනෝද්වාරයත් ආවර්ජන සිතක්. එතකොට මේ පංචද්වාරාවර්ජනය සහ මනෝද්වාරාවර්ජන යන සිත් දෙකම ක්‍රියා මාත්‍ර සිත්. ඒක නිසා ඒවාට කියනවා **ක්‍රියා අව්‍යාකෘත ධර්ම** කියලා. හේතුව, ඒ දෙකේම යම් කිසි මට්ටමක චෛතසික ධර්ම ටිකකුත් වැඩ කරනවා. මේ ක්‍රියා අව්‍යාකෘතයන්ට කලින් පහළ වෙච්ච භවාංගයත් අව්‍යාකෘත ධර්මයක්ම තමයි. එහෙම නම් ඒකෙ වෙනස මොකක්ද? භවාංගය කියන්නේ විපාක අව්‍යාකෘතයක්, ආවර්ජන සිත ක්‍රියා අව්‍යාකෘතයක්. ඒක නිසා කියනවා **පුරිමා පුරිමා විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං විපාකාබ්‍යාකතානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං අනන්තරපච්චයෙන පච්චයො**

කියලා. මෙතන කියන්නේ ඔක්කොම ටික එකට. ඒ කියන්නේ පංච ද්වාරාවජ්ජනයෙන් පස්සේ සහ ඊට කලින්.

**භවඞ්ගං ආවජ්ජනාය අනන්තරපච්චයෙන පච්චයො -** භවාංග සිත විපාකයක්. ආවර්ජන ක්‍රියා සිතට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

දැන් රහතන්වහන්සේලාගේ සිත් බැලුවොත් තිබෙනවා ක්‍රියා සිත්. රහතන්වහන්සේලාගේ ක්‍රියා සිත් එකින් එකට එකින් එකට දිගටම ක්‍රියාවෙන් ක්‍රියාවට, අව්‍යාකෘත ධර්මයෙන් අව්‍යාකෘත ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේවි ප්‍රත්‍යය වේවි තමයි යන්නේ. රහතන්වහන්සේ යම් කිසි රූපයක් දෙස බලනකොට උන්වහන්සේට පහළ වෙනවා ජවන් සිත් ජාතියක්. හැබැයි උන්වහන්සේගේ ජවන් සිත්වල චේතනාව හරියකට ක්‍රියාත්මක වෙන්නේ නෑ. ජවන් සිත් තිබෙනවා. නමුත් චේතනාව කර්ම හදන්නේ නෑ. නිකම්ම නිකම් barren සිත් හැටියට වඳ සිත් හැටියට කර්ම හදන්නේ නැති සිත් හැටියට ඒ ජවන් සිත් වල වැඩ කරනවා. ඒවා ක්‍රියා මාත්‍ර සිත් පමණයි. ඒක නිසා රහතන්වහන්සේ යමක් බලනකොට රහතන්වහන්සේ යමක් අහනකොට ඒවාගේම රහතන්වහන්සේ යමක් හිතනකොට කියනකොට සිත් පහළ වෙනවා. ඒ ඔක්කෝම, සිත් 17 පේළි පේළි පහළ උනත් ඒ සියල්ලක්ම ක්‍රියා සිත්. **අව්‍යාකෘත ධර්ම අව්‍යාකෘත ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේවී ප්‍රත්‍යය වේවී** පිහිටන තැනක් තමයි මේ. ඒවාගේම උන්වහන්සේලා ඵල සමාපත්තියට සමවදින කොටත් එයින් නැගිටින කොටත් ඇතිවෙන්නා වූ ස්වභාවයක් තමයි මේ.

ඒවාගේම උන්වහන්සේලා නිරෝධ සමාපත්තියට හරි ඵල සමාපත්තියට හරි සමවදිනවානම් ඒ හැම තැනකදීම උන්වහන්සේලාට කවදාකවත්ම කුසල් සිත් පහළ වෙන්නේ නෑ. ඒ සෑම තැනකදීම උන්වහන්සේලාට ඇතිවෙන්නේ ක්‍රියාවෙන් ක්‍රියාවට යන ස්වභාවයක්. ඒවාගේම විපාක අව්‍යාකෘත සහ ක්‍රියා අව්‍යාකෘතයන්.

දැන් මේ ධර්ම කාරණය අපි ඔය විදියට තේරුම් ගනිමු. මතක තබා ගනිමු.

**6) අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** = අව්‍යාකෘත ධර්මයක් කුසල ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙයි.

දැන් මේ කියන්නේ පළවෙනි ජවනය සහ ඊට කලින් පහළ වෙන සිත පිළිබඳව. පිං සිත් වල පළවෙනි ජවනය කුසල ධර්මයක්. මේක රහතන්වහන්සේගේ සිත් ගැන කථාවක් නොවෙයි. මේක සාමාන්‍යයෙන් රහත් භාවයට ගියේ නැති අනාගාමීන් වහන්සේලාත් ඇතුළුව පෘතක්ජන ආර්ය උන්වහන්සේලාගේ සිත්. පළවෙනි ජවනයට කලින් තිබෙන්නේ අව්‍යාකෘත ධර්මයක්. පංචද්වාර සිත්වල නම් වොත්ථපනය, මනෝද්වාර සිත්වල නම් මනෝද්වාරාවජ්ජනය. ජවනයට කලින් තිබෙන වොත්ථප සිත අව්‍යාකෘත ධර්මයක්. මේ අව්‍යාකෘත ධර්මයට පස්සේ පහළ වෙන්නේ පළවෙනි ජවනය. ඒක කුසල් සිතක්. ජවනයට කලින් පහළ වෙන්නා වූ අව්‍යාකෘත ධර්මයෙන් කුසල ධර්මයට යම් කිසි ප්‍රත්‍යයක් ලබා දෙනවා. ඒක නිසා කියනවා **අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියලා. මේක සිදුවෙන්නේ කුසල් සිත් පහළ වෙන අවස්ථාවේ. පිං කරන අවස්ථාවේදී ඇතිවෙන සිත්වල. මෙතනදී වොත්ථපනයයි මනෝද්වාරාවජ්ජනයි මේ විදියට පළවෙනි කුසල ජවනයට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

**7) අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො**

මේ කියන්නේ අකුසල චිත්ත වීථියක සිද්ධ වෙන දේ. මෙහිදීත් අකුසල් ජවනය පහළ වෙන්න කලින් පහළ වෙන වොත්ථපන සිත එහෙම නැත්නම් මනෝද්වාරආවජ්ජන සිත. ඒ වොත්ථපන සිත හරි මනෝද්වාර ආවජ්ජන සිත හරි පළවෙනි අකුසල ජවනයට අව්‍යාකෘත ධර්මයක් හැටියට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. මේ කියන්නේ අකුසල පැත්තෙන් - **අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො.**

එතකොට මේ හැම සන්ධිස්ථානයක්ම ලස්සනට කියලා තිබෙනවා.

1) කුසල ධර්මයක් කුසල ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන විදිය.

2) චිත්ත වීථියේ අවසාන ජවනය ළඟ භවාංගය - කුසල ධර්මයක් අව්‍යාකෘතයකට ප්‍රත්‍යය වෙන විදිය
3) අකුසල ධර්මයක් අකුසල ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන විදිය.
4) අකුසල ධර්මයක් අව්‍යාකෘතයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන විදිය
5) අව්‍යාකෘතයක් අව්‍යාකෘත ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන විදිය.
6) ජවන් සිත් වලට කලින් අව්‍යාකෘතයක් කුසලයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන විදිය.
7) ජවන් සිත් වලට කලින් අව්‍යාකෘත ධර්මයක් අකුසල ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන විදිය.

මෙන්න මේ විසර්ජනා වාර පේළි හතක් ගොනු කරලා මේකේ තිබෙන්නා වූ අනන්තර ප්‍රත්‍යය ශක්තිය ක්‍රියාත්මක වෙන විදිය අපිට පහදලා දීලා තිබෙනවා. ඉතින් අපි භාවනාවක් හැටියට මේක අහන්න ඕනෑ. හිතන්න ඕනෑ. ඒවාගේම මෙනෙහි කරන්න ඕනෑ. මේ හිත්වල ඈත අතීතයේ ඉඳලා මේ මොහොත දක්වාම එකින් එකට එකින් එකට ගලාගෙන ආපු සාංසාරික සිත් පෙළක්, සිත් පෙරහැරක්, සම්බන්ධයක් තිබෙනවා. සමහර වෙලාවට අපිට කියන්න බෑ අපි කොහේ හරි ඈත අතීතයක මොකක් හරි හේතුවක් නිසා අසංඥ තලයට ගියාද කියලා. අසංඥ තලයට ගියා නම් එතැනත් තිබෙනවා කල්ප 500 ඉඳලා ප්‍රතිසන්ධිය ගන්න තැනට සම්බන්ධයක්. නිරෝධ සමාපත්තියට නම් සමවදිලා නෑ කියලා විස්වාසයි රහත් නොවී නිසා. එතකොට අපි අතීත සංසාරයේ ඉඳලා මේ ආපු හිත් පේළියේ පළවෙනි සිතෙන් දෙවෙනි සිතට ලබා දීපු යම් කිසි දෙයක් දෙවෙනි සිත හැම වෙලේම එක්කාසු කරගෙන අරගෙන ඇවිල්ලා තිබෙනවා. මේවගේ එකක් නොවෙයි ගොඩාක් තිබෙනවා. ඒ ගොඩේ එක ගුණ ශක්තියක් තමයි **අනන්තර ප්‍රත්‍යය** හැටියට මේ විස්තර කරලා තිබෙන්නේ. ඒ නිසා මේ **අනන්තර ප්‍රත්‍යය** වෙලා තිබෙනවා එක එක විදියට අතීතයේ ඉඳලා මේ මොහොත දක්වාම. හැබැයි ඒ අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ ළඟම තිබෙන සිතක් මිසක එකක් skip කරලා නොවෙයි. ඊළඟට තිබෙන සිත කාල වශයෙන් දුර උනාට ප්‍රශ්නයක් වෙන්නේ නෑ. ඊළඟට පහළ වෙන සිතට මේකේ ආනුභාවය ලබා දෙනවා.

මේ අනන්තර ප්‍රත්‍යය කියන එක රූපමය වශයෙන් පේන දෙයක් නොවෙයි. ඒවාගේම ඒක හිතකුත් නොවෙයි. අනන්තර ප්‍රත්‍යය කියලා කියන්නේ චෛතසිකයකුත් නොවෙයි. ඒ සිත්වල සහ චෛතසික ධර්ම වල තිබෙන්නා වූ තවත් අමුතුම විදියේ ගුණ විශේෂයක් තමයි අනන්තර ප්‍රත්‍යයෙන් විස්තර කරන්නේ. මෙය සිතත් නොවෙයි චෛතසිකත් නොවෙයි රූපත් නොවෙයි නිර්වාණයත් නොවෙයි. අනන්තර ප්‍රත්‍යය කියලා කියන්නේ සිත්වල සහ චෛතසික ධර්ම වල තිබෙන්නාවූ සූක්ෂම වූ අමුතුම විදියේ බලපෑම් ගුණ විශේෂයක්. හැබැයි සිතක් නැත්නම් චෛතසික නැත්නම් අනන්තර ප්‍රත්‍යය කියන එක වැඩ කරන්න, ක්‍රියාත්මක කරන්න තැනක් නෑ. ඒක නිසා නිර්වාණ ධාතුවේ මේක පිහිටන්නේ නෑ. නිර්වාණ ධාතුව ඇතිවේවි නැතිවෙන දෙයක් නොවෙයි. ඒක නිසා අනන්තර ප්‍රත්‍යය තිබෙන්නේ චිත්ත චෛතසික ධර්මයන්ගේ පමණයි.

ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ පාරමී ගුණයන්ගෙන් පිරී ඉතිරී ගියාවූ උන්වහසේගේ ඒ ඥානයෙන් පිරිච්ච බැබලෙන ඒ හිතෙන් උන්වහන්සේගේ නුවණින් මෙන්න මෙහෙම දෙයක් හිතකින් හිතකට යන ස්වභාවයක් හිතකින් හිතකට බලපාන ගතියක් තිබෙන බව උන්වහන්සේ දැන ගත්තා දැක ගත්තා. අපේ සාරිපුත්ත මහා රහතන්වහන්සේ උන්වහන්සේගේ නුවණ යොදලා මේක තව විස්තර කරලා තිබෙනවා. බුදුරජාණන්වහන්සේගේ ධර්ම පේළියේ වැඩ ඉඳගෙන ඒකෙන් බොහෝම අල්ප මාත්‍ර බොහෝම පුංචි පුංචි කොට්ඨාසයක් තමයි අපි මේ සාකච්ඡාවකට එක්කාසු කරගත්තේ. අනන්තර ප්‍රත්‍යය පිළිබඳව මෙන්න මේ විදියට විසර්ජනා වාර හතක් තිබෙනවා. ඒ හතෙන් මේ ටික අපිට ඒ ගෞරවණීය ස්වාමීන්වහන්සේලා පහදලා දීල තිබෙනවා. ඒ නිසා මේ වෙලාවේ මේ පින්වත් සැම දෙනාම මේ දහම් කොට්ඨාශය ඇසුවා. එයට අනුව හිතුවා. මෙනෙහි කළා. මේ තුලින් උපදවාගත්තා වූ ඉපදුනා වූ දැනුවත්ව හෝ නොදැනුවත්ව ඇතිකර ගත්තාවූ ඒ සියලුම කුසල චේතනාවන්ගේ ධර්ම චේතනාවන්ගේ ආනුභාව බලයෙන් සැමදෙනාටම සමථ භාවනාවන් වැඩේවා! විපස්සනා භාවනාවන් වැඩේවා! මේ කියන්නාවූ ධර්ම කරුණු තේරුම් ගන්න ලැබේවා! සංසාරයේ අතරමං නොවී ලෙහෙසියෙන් පහසුවෙන්ම චතුරාර්ය සත්‍යයන් අවබෝධය කොටගෙන බුද්ධාදී උත්තමයන් වහන්සේලා

අවබෝධකොට ගත්තාවූ සදාකාලික සැප ඇති නිර්වාණ ධාතුවෙන් නිවී සැනසී මේ හේතුඵල සංසාර සමුදායෙන් ගොඩ වී නිවෙන්න සැනසෙන්න ලැබේවා! නිර්වාණ ධාතුව අවබෝධ කරගැනීම පිණිස මේ පිං හේතු වසනා වේවා! කියලා බොහෝම මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

ප්‍රශ්නයක් - අවසරයි ස්වාමීන්වහන්ස බොහොම පිං. ස්වාමීන්වහන්ස මට ප්‍රශ්න කීපයක් ඇති උනා **අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියන තැනදී. අපි නිදාගෙන ඉන්නකොට හීන දකින්නේ නැති වෙලාවක පන්චද්වාරාවජ්ජන සිතක් ඇතිවෙනවද කියලා හිතුනා. ඊළඟට ස්වාමීන්වහන්ස ජවන් සිත්වල විතරක් නෙමෙයි වීථියක අනිත් සිත්වලත් අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන අවස්ථාක් කියලා හිතුනේ. ඒක ගැන පොඩ්ඩක් පැහැදිලි කරගන්න අවශ්‍යයි ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

පිළිතුර - අපි නිදාගෙන ඉන්න වෙලාවේදී හොඳටම නින්ද ගියොත් අව්‍යාකෘත ධර්ම පහළ වෙනවා. ඒ භවාංග සිත්. හැබැයි සිහින දකින වෙලාවේදී බොහොම දුර්වල, හරියට ගලපා ගන්න බැරි ඉතා ඉක්මනින් මතකය කඩා වැටෙන මනෝද්වාරික සිත් වලින් තමයි හීන දකින්නේ. අපි හීනෙන් කනවා. හීනෙන් බය වෙනවා. හීනෙන් දුවනවා. ඒවාට සුදුසු ජවන් එක දෙකක් හෝ පහළ වෙන්න ඕන. හීනෙන් දානයක් දුන්නත් කෙනෙකුට හිතන්න පුළුවන් පිනක් සිද්ධ වෙනවද කියලා. ඇත්ත වශයෙන්ම සිද්ධ වෙන්න පුළුවන්. හැබැයි ඒවා එච්චර හයිය හිත් නොවෙයි. සමහර අය හීනෙන් බයවෙලා තිබෙනවා. බය කියලා කියන්නේ මනෝද්වාරික ද්වේශ ජවන්. සමහර ඒවා මතකයි.

අව්‍යාකෘත ධර්ම අව්‍යාකෘත ධර්මයකට බලපානවා කියලා කියන්නේ ඒක නිදාගෙන ඉන්දෙද්දී හෝ වේවා අවධියෙන් ඉන්දෙද්දී හෝ වේවා අරමුණක්

ඉදිරිපත් උනහම භවාංග රාශියෙන් මිදිලා ක්‍රියත්මක සිත්වලට එනවා. ක්‍රියාත්මක සිත්වලට එනකොට එන්නේ

- භවාංග - භවාංග චලන = විපාකයෙන් විපාකයට. අව්‍යාකෘතයෙන් අව්‍යාකෘතයට.
- භවාංග චලනයෙන් භවාංග උපච්ඡේදයට = විපාක අව්‍යාකෘතයෙන් විපාක අව්‍යාකෘතයට
- භවාංග උපච්ඡේදයෙන් මනෝද්වාරාවජ්ජනයට = විපාක අව්‍යාකෘතයෙන් ක්‍රියා අව්‍යාකෘතයට

<u>ඇහැරලා ඉන්න වෙලාවක පන්චද්වාරික පැත්තට යනවා නම්</u>

- භවාංග චලනයෙන් පන්චදවරාවජ්ජනයට = විපාක අව්‍යාකෘතයෙන් ක්‍රියා අව්‍යාකෘතයට
- පන්චදවාරාවජ්ජනයෙන් චක්ඛු විඤ්ඤාණයට = ක්‍රියා අව්‍යාකෘතයෙන් විපාක අව්‍යාකෘතයට
- විඤ්ඤාණයෙන් සම්පටිච්ඡන වලට = විපාක අව්‍යාකෘතයෙන් විපාක අව්‍යාකෘතයට
- සම්පටිච්ඡනයෙන් සන්තීරණ වලට = විපාක අව්‍යාකෘතයෙන් විපාක අව්‍යාකෘතයට
- සන්තීරණ වලින් වොත්ථපනයට = විපාක අව්‍යාකෘතයෙන් ක්‍රියා අව්‍යාකෘතයට

ඔය විදියට තමයි මේ හරියේ අව්‍යාකෘත ධර්ම ක්‍රියාත්මක වෙන්නේ. රහතන්වහන්සේ සිතේ හැම තැනම තිබෙන්නේ අව්‍යාකෘත ධර්ම.

<u>ප්‍රශ්නයක්</u> - **අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියන තැනදී ප්‍රත්‍යය උප්පන්න හැටියට ලැබෙන අව්‍යාකෘත ධර්ම හැටියට සඳහන් උනා මහගත්ත විපාක සිත් 9. එතනදී තේරුම් ගත්තේ භව නිකාන්තිය නම් ඒ භවය කෙරෙහි දක්වන යම් කිසි ලෝභ සහගත ගතියක් කියලා. ඒ ලෝභ සිතේ අවසානය ජවනයෙන් පස්සේ ඇතිවෙන මහග්ගත විපාක සිතක් කියලා. ඒවගේම ඔබවහන්සේ කලින් සඳහන් කළා චුතිය සිද්ධ වෙන අවස්ථාවේ අවසානයේදී සිද්ධ වෙන්නේ කාමාවචර චිත්ත වීථියක් කියලා. ඒ

චිත්ත වීථිය අවසානයේදී ඇතිවෙන මහග්ගත විපාක භවාංගය කියලා හිතෙනවා. ඒක කොහොමද ස්වාමීන්වහන්ස ඒක විස්තර කරගන්නේ.

<u>පිළිතුර</u> - මහග්ගත සිත් කියලා ගත්තහම සිත් 9 තිබෙනවා, රූපාවචර ධ්‍යාන ක්‍රමයේ හැටියට 5 කුත් අරූපාවචර ධ්‍යාන ක්‍රමය අනුව 4 කුත්. යම් කිසි කෙනෙක් මිය පරලොව ගිහිල්ලා බ්‍රහ්මලෝකයේ උප්පත්ති වශයෙන් රැඳුනොත් එයාට රූපාවචර හෝ අරූපාවචර භවාංග සිත වන්නේ ඒ ප්‍රතිසන්ධි සිතයි. ඒ ප්‍රතිසන්ධිය ගන්න අවස්ථාවේදී හැම එක්කෙනාටම පහළ වෙනවා අව්‍යාකෘතයක්. එතකොට අව්‍යාකෘතයෙන් ස්ථාන 9 යක 9 දෙනෙක් පහළ උනොත් එහෙම කරපු භාවනා කර්මස්ථාන වල හැටියට ඒ 9 දෙනාගේම ප්‍රතිසන්ධිය අව්‍යාකෘත සිත්. අව්‍යාකෘත විපාක සිතෙන් පස්සේ හැම එකෙනාගේම සිත් භවාංග වෙනවා. එතකොට භවාංග සිත් ඔක්කෝම අව්‍යාකෘතයයි. ඔය හැම එක්කෙනාම ඒ ඒ ස්ථාන වල ඉන්නකොට ජීවිතියෙන් ජීවිතියට වෙනස් වෙනවා. නමුත් පොඩ්ඩක් හරි ලෝභ සහගත ගතියක් මෝහ සහගත ගතිය තිබෙනවා නම් බ්‍රහ්මලෝකේ කියලා හරි යන්නේ නෑ, ඒවා දාන්නේ අකුසල් සිත් වලට. අපි දන්නවා අහලා තිබෙනවා රූපාවචර බ්‍රහ්මලෝකේ බක කියල බ්‍රහ්මයෙක් ගැන. බක බ්‍රහ්මයට තිබුණේ මිත්‍යාදෘෂ්ඨිය. ඒවගේම ඔය බ්‍රහ්මයෝ විස්වාස කරනවා මවපු කෙනෙක් ඉන්නවා, තමන්ට කලින් හිටපු කෙනෙක් ඉන්නවා කියලා, ඔය වගේ දේවල් විස්වාස කරනවා. ඕවා දෘෂ්ඨිගත සිත්. ඒවා අකුසලයි. එයා බ්‍රහ්මලෝකයේ හිටියත් අකුසල් සිත් පහළ වෙලා ඒ චිත්ත වීථිය අවසානයේදී භවාංග වෙනකොට තමයි **අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියලා කියන්නේ. ඔය සාමාන්‍යයෙන් රූපාවචරයේ.

අරූපාවචරයෙත් ඕක වෙනවා. අරූපාවචරයේ සිටින බ්‍රහ්මයන්ට ඉතා සියුම් ආකාරයට ඉන්න තැන ආරම්මණයට ඇලීමක් හැදෙනවා. අගේ කිරීමක් හැදෙනවා. ඒ චිත්ත වීථිය අවසානයේදී භවාංග වෙනකොටත් **අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො**. එතකොට අනිත් එක තමයි අරූපාවචර බ්‍රහ්මයෙක් රූපයකට හැරිලා නැවත එනකොට එයාගේ සිතත් කැඩිලා එන්නේ අකුසල් ජේළියකට අනුව. එතකොට වෙන්නේ **අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො.**

හැබැයි ඒක තේරුම් ගන්න වෙන්නේ, අපි අකුසල් සිත් 12 ක්‍රියාත්මක වෙන ආකාරය මේ දක්වා දැනගෙන කථා කරලා තිබෙන්නේ අපේ කාම ලෝකයේ මට්ටමටයි, ඒ තරම් සැර විදියට. නමුත් මේ ස්වභාවය යම්තම් හරි එක හිතකින් හරි අපි හිතමු ආකාස අරම්මණයට හෝ විඤ්ඤාණ ආරම්මණයට හෝ වේවා ලැදිව අගය කිරීමක් ලෝභ කිරීමක් ඇති වෙනවා නම් ඒකත් අකුසල් හැටියටයි ගැනෙන්නේ. ඒක නිසා ඒ ඔක්කෝම ටික මේකේ අන්තර්ගත කරලා තිබෙනවා. ඒ පහළ වෙච්ච ස්ථානවල අකුසල් සිත් පේළියක් ගිහිල්ලා භවාංග ගත වෙන තැන තමයි කියන්නේ **අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස** කියලා. අපි තේරුම් ගන්න ඕන ලෝභ සිත් වැඩ කරන තැන්.

තවත් එකක් තිබෙනවා. ඒක ලෝභම නොවෙයි නමුත් බ්‍රහ්මයන්ට එක කාලයකදී එපා වීමක් වෙනවලු බ්‍රහ්මලෝකය එකාකාරී කියලා. ඉදලා ඉදලා එකාකාරී නිසා හිතනවා කියනවා 'මට පාළුවට තවත් කෙනෙක් ඉන්නවා නම් හොඳයි' කියලා. ඒක පැතීමක්. 'තවත් එක්කෙනෙක් මට ඉන්නව නම් හොඳයි' කියලා පහළ කරන සිත පිං සිතුවිල්ලක් නෙමෙයිනේ. ආන්න ඒ වගේ බ්‍රහ්මලෝකයේ ඔය මට්ටමෙන් ලෝභ සිත් පහළ වෙනවා. ඒකයි ඔය කියන්නේ. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස කාම රූප අරූප කියන භව තුනටම භව නිකාන්තිය කියන එක පොදුවේ බලපෑමක් තිබෙනවාද?

<u>පිළිතුර</u> - අනිවාර්යයෙන්ම තිබෙනවා. භව නිකාන්තිය ඇතිවෙන්නේ ප්‍රති සන්ධිය ගත්තු වෙලාවේදීමයි. එතනත් සියුම් ලෝභ සිත් ක්‍රියාත්මක වීමක් සිදුවෙනවා.

එහෙමයි ස්වාමීන්වහන්ස සවනට සිසිලස වෙනුවෙන් ඉතාමත් කෘතවේදීව පුණ්‍යානුමෝදනා කර සිටිනවා ස්වාමීන්වහන්ස අද දවසේත් අපිට ඉතාමත්ම වටිනා ධර්ම කාරණා මේ අයුරින් මතු කර දීම පිළිබඳව. එහෙම නම් ඔබ

වහන්සේට ඉතාමත් ගෞරවයෙන් යොමු වෙනවා අද දවසේ සාකච්ඡාව නිමා කරන ලෙසට ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

හොඳයි, පින්වත් සැම දෙනාටම තෙරුවන් සරණයි! අදත් අපි ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ දේශිත ත්‍රිපිටක ධර්මයේ තවත් කාණ්ඩයක් අරගෙන මේ පින්වතුන්ට ගැලපෙන ප්‍රමාණයෙන් හිතන්න පුළුවන් ප්‍රමාණයෙන් අපි කරුණු විස්තර කරලා දුන්නා. පට්ඨානය කියලා කියන්නේ මහා විසාල ධර්ම නියායක් කියන්නා වූ ධර්ම කාණ්ඩයක්. ඒකෙ එක නියායක තමයි අපි මේ ඉන්නේ. තව ගොඩක් තිබෙනවා බලන්න පැති. අනන්තර ප්‍රත්‍යය සිද්ධවෙන තැන් ගැන තමයි මේ කිව්වේ. ඉතින් මේ තුලින් අපි යම් කිසි දහම් දැනුමක් ලබා ගත්තා. අසා තිබු දේ අලුත් කරගත්තා. නොඇසූ දෙයක් අලුතෙන් අසා ගත්තා. මේ විදියට අපි වටිනා කුසල ධර්ම සමුදායක් රැස්කරගෙන අපේ ජීවිතියට ශක්තියක් හදා ගත්තා. මේ පින මේ කුසල ශක්තිය ඒකාන්තයෙන්ම සැම දෙනාටම ධර්ම අවබෝධය පිණිස වේවා! මේ දහම් වැඩ සටහනේ ආරම්භක පින්වත් ලලිත් දළුවත්ත මහත්මයාටත් නිදුක් නිරෝගී දීර්සායුෂ වේවා! පවුලේ සැම දෙනාටමත් සැනසිල්ල යහපත පිණිස වේවා! දහම් වැඩ සටහන මෙහෙයවන පින්වත් අපේ ජයන්ත මහත්මයා ප්‍රශ්න ඇසූ ඒ පින්වත් මහත්මිය අසාගෙන සිටියාවූ සැම දෙනාටමත් මේ උතුම් ධර්ම බලයෙන් සුවසේම ගුණ පිළිවෙත් පුරාගෙන සැපසේ ධර්ම මාර්ගයේ ගමන්කොට සැපසේම උතුම් නිර්වාණ ධාතුව අවබෝධ වේවා! නිර්වාණ ධාතුව ප්‍රත්‍යක්ෂ අවබෝධය පිණිස මේ කුසල් මේ පිං හේතු වසනා වේවා! කියලා මෛත්‍රීයෙන් පින් දෙමින් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.